## ජංගම දුරකථන හා අන්තර්ජාලය

- හය හතර නොදත් ඔබගේ දරුවා ජංගම දුරකථන ඔස්සේ එන කාමාතුරයන්ගේ රැවටීම්වලින් බේරාගන්න
- ඔවුන් ඔබේ දරුවන්ගේ ඡායාරූප විකෘති කොට සමාජජාලා වෙබ්අඩවිවල දමා දැඩි අසීරුතාවයකට පත්කළ හැකිය
- මෙවන් සිදුවීම්වලින් අසීරුතාවයට පත්වන දරුවන් සියදිවි නසා ගත් අවස්ථාද ඇත.
- ජංගම දුරකථනය මගින් සමාජ වෙබ් අඩවිවලට පිවිසිය හැකි නිසා එහි ඇති අසභ්‍ය දේ වෙත නොදැනුවත්ව දරුවා යොමුවේ
- වැඩිහිටියන් වුවද සමාජ වෙබ් අඩවි  භාවිතා කරන්නේ නම් තමාගේ  ඡායාරූප දුරකථන අංක හෝ පුද්ගලික තොරතුරු එහි ගබඩා කර නොතබන්න
- තමාගේ අතිශය පෞද්ගලික තොරතුරු අන් අය සමග බෙදාගැනීම, සාකච්ඡා කිරීම නොකරන්න





## ගමනාන්තවලදී සිදු කෙරෙන ළමා අපයෝජන

ඔබ සමීපයට එන හෝ ඔබ යන ගමනාන්තවලදී දෙස් විදෙස් වන්දාකරුවන් හා සංචාරකයන් ද හමුවේ. ඔවුන් අතර ළමා අපයෝජකයන් සිටින්නට පුළුවන. ඒ පිළිබඳ විමසිලිමත් වන්න. මෙවැනි අවස්ථාවලදී ඕනෑම කෙනෙකු දෙන තෑගිබෝග සහ ඇඟෑළුම්කම් කෙරෙහි විමසිලිමත් වන්න.
ගැහැණු ළමුන් මෙන්ම පිරිමි ළමුන්ද ලිංගික අපයෝජනයට ගොදුරු විය හැකිය.
එයින් දරුවා මානසික ශාරීරික වශයෙන් පීඩාවට ලක්වේ, භයානක සමාජ රෝගවලට දරුවා ගොදුරුවිය හැකිය.
අධ්‍යපනය කඩාකප්පල් විය හැක.
වැඩිහිටියන් වූ පසුවද පවුල් ජීවතයේදී ප්‍රශ්න ඇතිවිය හැකිය.
අපයෝජනය වූ ළමුන් ඔබ නොදුටුවද එසේ වූ අය බොහෝ ඇත.

**පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය**

අංක 165/2, දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථනය: 0112 819397 ජංගම: 0712 733037
ෆැක්ස්: 0112 768862
විද්‍යුත් ලිපිනය: info@ecpatsrilanka.org

# ළමයින්ගේ ආරක්ෂාව

## පිළිබඳ පහසු මගදැන්වීම

කාලීන අවශ්‍යතා මත දෙමාපියන් විසින් දැනුවත් විය යුතු කරුණු සම්පිණ්ඩනය කර "පීස්" සංවිධානය විසින් සකසන ලද ප්‍රකාශනයකි.



PEaCE

**පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය**

**එක්පැට් ශ්‍රී ලංකා**

ecpat

අංක 165/2 දුටුගැමුණු වීදිය කොහුවල


## ඔබේ දරුවා රැක ගන්න

දයාබර අම්මේ තාත්තේ, සහෝදර සහෝදරයිනි
ඔබ බොහෝ දුක් විඳින්නේ මහන්සි වෙන්නේ ඔබගේ දරුවන් වෙනුවෙන්ය. ඕනෑම තැනක, ඕනෑම මොහොතක, ඕනෑම දිනයක, දන්නා හඳුනන, හෝ නොදන්නා තරුණ, මහළු, පිරිමි, ගැහැණු යන අය අතර සිටින ඕනෑම අයෙකු විසින් ඕනෑම දරුවකු අපයෝජනය වෙන්න පුළුවන්. මෙවැනි වැරදි කරන අය අවුරුදු 20 දක්වා කාලයක් හිරගෙදරට යවන්න පුළුවන්.



## අයුතු ලෙස ස්පර්ශ කිරීම

පහත රූප සටහනේ දක්වා ඇති සිරුරේ කොටස් අයුතු ලෙස, ලැජ්ජාවක්, බියක්, පිළිකුලක්, වේදනාවක්, දැනෙන ලෙසට ස්පර්ශ කිරීම වරදකි.



කවරෙකු හෝ එවැනි අයුතු ස්පර්ශයක් සිදුකරයි නම්, ඔබගේ දරුවාට පහත  උපදෙස් ලබා දෙන්න

- කෑගසන්න
- මිනිසුන් ඇති තැනකට දුවන්න
- උදව් ඉල්ලන්න
- විශ්වාසවන්ත වැඩිහිටියකුට පවසන්න
- මෙවැනි දේ රහසක්ව තබා නොගන්න
- ඔබට අප්‍රිය ඔබ අකමැති දෙයක් වැඩිහිටියකු කරනවානම් වහාම එයට විරුද්ධ වන්න.



## ළමා විවාහ

- ශ්‍රී ලංකාවේ නිතියට අනුව 18 අඩු අයට විවාහය ලියාපදිංචිකළ නොහැක.

එසේ විවාහ වුවහොත්,

- විවාහය වලංගු නොවේ
- අධ්‍යපනය බිඳ වැටේ
- සෞඛ්‍ය පිරිහේ
- සුන්දර ළමාවිය අහිමිවේ
- එවැනි විවාහයක් ලියාපදිංචි කිරීමට පියවර ගත් රෙජිස්ටාර්වරයාට හා දෙපාර්ශවයේම ඥාතීන්ට එරෙහිව නීතිමය පියවර ගත හැකිය

